කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

## 2026 මැයි මස 15 දිනය සඳහා කාලගුණ අනාවැකිය
## 2026 මැයි මස 14 දින ප.ව. 2.00 ට නිකුත්කරන ලදී

**අද (මැයි 14) දින උදෑසන දත්ත විශ්ලේෂණ අනුව, ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් පිහිටා ඇති අඩු පීඩන කලාපය තවදුරටත් පවතී. ඉදිරි පැය 48 තුල එම පද්ධතිය ශ්‍රී ලංකාවෙන් ඉවතට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.**

**දිවයිනේ බොහෝ ප්‍රදේශවල අහස වලාකුළින් බරව පවතී.**

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, වයඹ සහ උතුරු පළාත්වලත් අනුරාධපුර, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් පුත්තලම, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වලත් ඇතැම් ස්ථානවල මි.මී. 100 ට වැඩි තද වැසි ඇතිවිය හැක.

ඌව පළාතේ ඇතැම් ස්ථානවලට පස්වරු 1.00 න් පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 15 May 2026
## Issued at 2.00 p.m. on 14 May 2026

**The low pressure area located northeast of the Sri Lanka, still persist. This system is expected to move away from Sri Lanka during the next 48 hours according to the latest weather analysis based on May 14th morning.**

**Cloudy skies are expected over most parts of the island.**

Showers or thundershowers will occur at times in Western, Sabaragamuwa, Central, North-western and Northern provinces and in Anuradhapura, Galle and Matara districts.

Heavy showers above 100mm are likely at some places in Western and Sabaragamuwa provinces and in Puttalam, Galle and Matara districts.

Showers or thundershowers may occur at some places in Uva province after 1.00 pm.

**The general public is kindly requested to take adequate precautions to minimize damage caused by temporary localized strong winds and lightning during thundershowers.**

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


## ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2026 මැයි මස 14 දින ප.ව. 2.00 ට නිකුත් කරන ලදී**

| |
|---|
| **අද (2026-05-14) දින උදෑසන දත්ත විශ්ලේෂණ අනුව ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් පිහිටා ඇති අඩු පීඩන කලාපය තවදුරටත් පවතී. ඉදිරි පැය 48 තුල එම පද්ධතිය ශ්‍රී ලංකාවෙන් ඉවතට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.**<br>**මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් ඉදිරි දිනවලදී දිවයින වටාවන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය සහ වැසි තත්ත්වය වැඩිවිය හැක.**<br>මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ධීවර සහ නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ. |
| **වැසි තත්ත්වය:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. |
| **සුළඟ:** |
| සුළං නිරිත දෙසින් හමා එන අතර සුළගේ වේගය පැ.කි.මී. **(25-35)** පමණ වේ. **ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරේ, පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-60) පමණ දක්වා ඉහළ යා හැක.** |
| **මුහුදේ ස්වභාවය:** |
| **ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරේ, පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල්** දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මඳ වශයෙන් රළු විය හැක.<br>**පුත්තලම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස මීටර් (2.0 – 2.5) ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතී.** (මෙය ගොඩබිමට එන රළ උස නොවේ).<br><br>**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.** |

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 2.00 p.m. on 14 May 2026**

| |
|---|
| **The low pressure area located northeast of the Sri Lanka, still persist. This system is expected to move away from Sri Lanka during the next 48 hours according to the latest weather analysis based on May 14th morning.**<br>**Under the influence of this system, wind speed and rainy conditions over the sea areas around the island may increase in the coming days.**<br><br>The naval and fishing communities are requested to be attentive to the future forecasts and bulletins issued by the Department of Meteorology in this regard. |
| **Condition of Rain:** |
| Showers or thundershowers will occur at times in the sea areas around the island. |
| **Winds**: |
| Winds will be South-westerly. Wind speed will be (25-35) kmph. **Wind speed can increase up to (50-60) kmph at times in the sea areas off the coast extending from Trincomalee to Pottuvil via Kankasanthurai, Puttalam, Colombo, Galle and Hambantota.** |
| **State of Sea:** |
| The sea areas off the coasts extending from Trincomalee to Pottuvil via Kankasanthurai, Puttalam, Colombo, Galle and Hambantota will be rough at times. The other sea areas around the island can be moderate.<br>**The swell waves (about 2.0 – 2.5 m) height** (this is not for land area) **may increase in the sea areas off the coast extending from Puttalam to Pottuvil via Colombo, Galle and Hambantota.**<br><br>**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.** |

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි